# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,989 — 1933ක්වූ ජූනි මස 23 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.— හතරවෙනි කාණ්ඩය.

### උපාධිශ නීති.

වර්ෂ 1897 අංක 7 දරණ ආඥාපනතෙන් අමුතුකරන්ට යෙදුන වර්ෂ 1896යේ අංක 13 දරණ "වසංගතාගමන් පිළිබඳ ආඥාපණත" යයි නම්ලත් ආඥාපණතේ අංක 1 දරන වගන්තියේ ප්‍රකාර 1933ක් ජූලි මාසේ තලවිල සන්තාන දේවස්ථානයේ මංගල්‍යය සම්බන්ධව ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේවෙත 1931 ක් ලංකාවේ රාජ්‍යමන්ත්‍රණ සභාවේ අංක 93 දරණ නියෝගයෙන් එතුමාණන්වහන්සේට ලැබී තිබෙන බලය ප්‍රකාර පනවනලද නියෝගයයි.

බී. බී. ජයතිලක,
අභ්‍යන්තර කාර්‍ය්‍ය භාරකාර මන්ත්‍රීතුමා.

වර්ෂ 1933ක්වූ ජූනි මස 20වෙනි දින අභ්‍යන්තර කාර්‍ය්‍ය භාරකාර මන්ත්‍රීතුමාගේ කන්තෝරුවේදීය.

ව්‍යවස්ථා.

1. මෙම ව්‍යවස්ථාවල "ලැගුම්භූමිය" යන්නෙන් හඟවන්නේ මීට යාකර තිබෙන උප ලේඛනයෙහි සඳහන්වන සීමාතුළ පිහිටි භූමිභාගයයි. "උප දිසාපතිතුමා" යන්නෙන් හඟවන්නේ පුත්තලම හලාවත දෙපළාතේ උප දිසාපතිතුමාය.

2. උප දිසාපතිතුමාගේ විශේෂ හෝ සාමාන්‍ය ආඥාවකින් ලැගුම්භූමිය තුළ ලැගුම්ගැනීම තහනම්කරනලද කිසිම ස්ථානයක කිසිවකු විසින් ලැගුම් ගතයුතු නොවේ.

3. ශරීර කෘත්‍ය සඳහා උප දිසාපතිතුමා විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව වෙන්කර තිබෙන ස්ථානවල හැර ලැගුම්භූමිය තුළ අන් කිසි තැනක කිසිවකු විසින් මලමුත්‍ර නොකළ යුතුයි.

4. උප දිසාපතිතුමා විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව ඒ සඳහා වෙන්කර තිබෙන ස්ථානවල හෝ භාජනවල මිස ලැගුම්භූමියේ වෙන තැනක කිසිවකු විසින් කුණුකසල රොඩු ආදිය හෝ කුණු වතුර නොදැමිය යුතුයි.

5. (a) මැරීම පිණිස ලැගුම්භූමියට ගෙනෙනලද ගවයන් හා උප දිසාපතිතුමාගේ විශේෂ හෝ සාමාන්‍ය ආඥාවකින් එබඳු භූමියෙහි තබාගැනීමට අවසර දෙනලද ගවයන් හැර අන්කිසි ගවයකු ලැගුම්භූමියෙහි තබානොගත යුතුයි.

(b) උප දිසාපතිතුමා විසින් ගවගාලක් වශයෙන් විශේෂයෙන් නියමකරනලද තැනක හෝ ඒ කටයුත්තට යෙදීම පිණිස ඔහු විසින් අනුමතකරනලද තැනක හැර ලැගුම්භූමියට සමීපව වෙන තැනක ගවයින් නොතැබිය යුතුයි.

(c) ගවයින් භාරව සිටින අය උන්ගේ ගොම ඒට නියමකර තිබෙන අසල ස්ථානයකට ඉවත්කරවා තමාගේ ගවයන් ඉන්නාතැන සෑමවිටම පවිත්‍රකර තබාගත යුතුයි.

6. ආහාර පිණිස සෑදූ ලැගුම්භූමිය තුළ විකුණනුලබන සියලුම කෑම ජාති (a) පිරිසිදු කබඩ්සිවල නොහොත් රෙදිවල දවටා හෝ ඉන් වසා හෝ, (b) වසා නලද වීදුරු පෙට්ටිවල දමා හෝ, (c) ලැගුම්භූමිය භාර සනීපාරක්ෂක නිලධාරීතුමා විසින් හෝ වෛද්‍ය නිලධාරීතුමා විසින් මැනවැයි පිළිගන්නාලද වෙනත් පියන් සහිත භාජනවල දමා හෝ මැස්සන්ගෙන් හා දූවිල්ලෙන් ආරක්ෂාකළ යුතුයි.

7. බෝවෙන රෝගයකින් පෙළෙන කෙනකුට හෝ ලැගුම්භූමියේ පවිත්‍රකමට බාධාවක්ව සිටියහැකි කෙනකුට ලැගුම්භූමියට ඇතුල්වන්නට ඉඩ නොදිය යුතුයි.

8. මංගල්‍යය කාලය තුළදී ලැගුම්භූමියෙහි යම් වසංගත රෝගයක් හටගැණුනිනම් වන්දනාකාරයින්ට වන්දනා භූමියෙන් පිටවී යන්නටද, පිටවී යන මාර්ගී සහ ඔවුන් ගෙනයන ක්‍රම නියමකරන්නටද උප දිසාපතිතුමාට පුළුවන.

9. (a) ලැගුම්භූමිය තුළ බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙළෙන සෑම අයද, (b) ඔහු එසේ පෙළෙන බව දැන දැනම ඔහු සමග වාසයකරන සෑම අයද ඒ රෝගියා ගැන ලැගුම්භූමිය භාරව සිටින සනීපාරක්ෂක නිලධාරීතුමාට හෝ වෛද්‍ය නිලධාරීතුමාට දැනුම්දෙන්නට ඕනෑය.

10. ලැගුම්භූමිය තුළ යම් වැවක් හෝ ළිඳක් යම් නියම කටයුත්තක් සඳහා වෙන්කොට ඒ බවට ඒ ස්ථානයෙහි දැන්වීමක් ගසා තිබෙන විට එම වැව හෝ ළිඳ එය වෙන්කොට තබා තිබෙන කටයුත්ත සඳහා හැර අන් කිසි දෙයකට කිසිවකු විසින් නොයෙදිය යුතුයි.

11. පාන්ගෙයක්, සිසිල්බීම සාදන ස්ථානයක් හෝ ගාලක් තැබීම පිණිස උප දිසාපතිතුමාගෙන් කලින් බලපත්‍රයක් ලබා නොගෙන කිසිවකු විසින් ලැගුම්භූමිය තුළ එබඳු ස්ථානයක් තබාගතයුතු නොවේ. බලපත්‍රය නොමිලයේ දෙනුලැබේ.

12. උප දිසාපතිතුමාගෙන් කලින් අවසර ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමියේ මහ වීදියෙන් හෝ වෙනයම් විදියකින් අසුවනසේ යම් කඩයක් තැනීම හෝ වෙනයම් ගොඩනැගිල්ලක් දික්කිරීම යුතුනොවේ.

13. උප දිසාපතිතුමාගෙන් කලින් අවසර ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමිය තුළ හෝ එහි මායිම්වල සිට සැතැප්මක් ඇතුළත හෝ ගිනිකෙළි හෝ තුවක්කු පත්තු නොකළ යුතුයි

14. උප දිසාපතිතුමා විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව ඒ සඳහා නියමකර තිබෙන ස්ථානයක හැර ලැගුම්භූමිය තුළ කිසිවකු විසින් සතුන් නොමැරිය යුතුයි. තවද එබඳු ස්ථානයෙහි සතුන් මරන සෑම අයම එය පවිත්‍රව තබාගැනීම ගැන වගකිය යුතුවේ.

උප ලෙඛනය.

තලවිල ලැගුම්භූමියේ සීමා.

උතුරට—තලවිලම්බෙයි ; දකුණට ඒතාලේ තලවිල සහ තේලා කුඩාතලවිල පාරවල්වල එරුම්කුඩල් හන්දියේ සිට කෙළින් බන්ඩාඹුර අතට මුහුදට යන පාර ; නැගෙනහිරට පණ්ඩාරම් කරුක්කුවච්චම්පෙරියකෝට්ටම් පාරවල් ; බස්නාහිරට මුහුද.

"බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ 1901කේ ආඥාපණත."

1920සේ අංක 11 දරන පළාත් ආණ්ඩුසභා සම්බන්ධ ආඥාපණතේ 245 යන වගන්තිය හා බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ 1901කේ අංක 25 දරණ ආඥාපණතේ 5වෙනි, 6වෙනි වගන්ති යටතෙහි කෝට්ටේ නගරබද ප්‍රදෙශ සභාව විසින් සම්පාදනයකරනලද උපනීති.

ඩී. ඇල්. ද සේරම්,
සභාපතිතැන.

1933ක්වූ ජූනි මස 10වෙනි දින කෝට්ටේ
පළාත් ආණ්ඩුසභා කාර්යාලයේදීය.

උපනීති.

1. කෝට්ටේ නගරබද ප්‍රදෙශසභාවට අයත් සීමාතුළ තබාගෙන සිටින සෑම බල්ලා නොහොත් බැල්ලී ගැන ඒ සතා රැකබලාගන්නා එසේ නැත්නම් අයිතිකාරව ඉන්නා අය විසින් රුපියල් 1·50ක් බල්ලන් ලියාපදිංචිකිරීම සඳහා අවුරුදු පතා ගෙවන ගාස්තුවක් වශයෙන් ගෙවිය යුතුය. මේ ව්‍යවස්ථාව උදෙසා අවුරුද්ද ගණිනුලබන්නේ එක් අවුරුද්දක අප්‍රේල් මාසයේ 1වෙනිද සිට ඊළඟ අවුරුද්දේ මාර්තු මස 31වෙනිද වනතුරුය.

2. ලියාපදිංචිකිරීමේ ගාස්තු අයකිරීම සඳහා නගරබද ප්‍රදෙශසභාවේ සභාපතිතැන විසින් පත්කොට සිටින (මෙහි මින්මතු අයකරු යනුවෙන් හඳුන්වන) තැනැත්තාට එක් එක් අවුරුද්දේ ජනවාරි මාසේ 31වෙනිදට මත්තෙන් නගරය ඇතුළත සෑම ගෙදරකම වාසයකරන්නකු විසින් ඒ ගෙදර හෝ ගෙදරට ඇතුළත් අවට භූමියෙහි හෝ තබාගෙන සිටින එක් එක් බල්ලා හෝ බැල්ලිය සම්බන්ධව විස්තර කරුණු මීට යාකොට තිබෙන A ආකෘතිපත්‍රයෙහි වුවමනාකරන පරිද්දෙන් සපයාදිය යුතුයි.

3. යටකී අයකරුට හෝ නගරබද ප්‍රදෙශසභාවේ ලේකම්තැනට හෝ නියමිත අයමුදල ගෙවූවිට B ආකෘතිපත්‍රයෙහිවූ පරිද්දෙන් ලියාපදිංචිකළ බවට සහතිකයක් දෙනුලැබේ.

4. (1) යම් බල්ලෙක් හෝ බැල්ලියක් හෝ ඉදින් :—

(a) අනිත් බල්ලන්ටද බෝවියහැක්කේයයි අයකරු හෝ ලේකම්තැන කල්පනාකරන ප්‍රමාණයකට රෝගයකින් පෙළේ නම් හෝ :

(b) වයස, ලෙඩ, තුවාල යන මෙයින් කිසිවක් නිසා තවත් ජීවත්ව සිටීන්ට සුදුසුනැතැයි තමන්ට කල්පනාවේනම්, එබඳු බල්ලකු හෝ බැල්ලියක් සඳහා ලියාපදිංචිකිරීමේ සහතිකයක් නොදෙන්නට අයකරු හෝ ලේකම්තැනට පුළුවන, නැත්නම්:

(2) ලේකම්තැන හෝ අයකරු මැනවයි සලකන කොයිම නියමයකට හමුත් යටත්කොට සහතිකයක් දෙන්නටද ඔහුට පුළුවන. එසේ සහතිකය නොදී හැරීම ගැන හෝ නියමයන්ට යටහත්කිරීම ගැන නොසතුටුවූ බල්ලන් අයිතිකාරයකුට ඊට විරුඬව නගරබද ප්‍රදෙශසභාවේ සභාපතිතැන වෙත පැමිණිලිකර සිටින්නට පුළුවන. එවිට එසේ නොදී හැරීම හෝ නියමයන්ට යටහත්කිරීම ස්ථිරකරන්නට හෝ මදක් වෙනස්කරන්නට හෝ අවලංගුකරන්නට හෝ සභාපතිතැනට පුළුවන.

5. ලියාපදිංචිකිරීමේ සෑම සහතිකයකම පහත සඳහන් නියමයන් මුද්‍රණයකොට තිබිය යුතුයි, එනම් :—

(a) සභාපතිතැනගේ කල්පනාවේ හැටියට තවත් ඉදිරියට ජීවත්ව සිටීමට සුදුසු නොවන අන්දමට බල්ලා තුවාලව හෝ රෝගාතුරව සිටිනම් එක්කෝ,

(b) ඒ බල්ලාගේ අයිතිකාරයා ඌට නිතිපතා හිරිහැර කරන බව හෝ ඌ ගැන සොයා නොබලන බව හෝ සභාපතිතැනට පෙනුනේ නම් එක්කෝ,

(c) ඒ බල්ලා බෝවෙන හෝ පැතිරයන ලෙඩකින් පෙළෙමින්-සිටියදී අනුන්ට අයිති වෙනත් බල්ලන් හා එකට නැවතෙන්නට ඌ අයිතිකාරයා විසින් ඉඩ හැරියේනම් මේ සහතිකය අවලංගුකරන්නට කෝට්ටේ නගරබද ප්‍රදෙශ සභාවේ සභාපතිතැනට පුළුවන.

6. සහතිකයක් දෙන්නට බැරිය කියනුලැබ හෝ දෙනලද සහතිකයක නියමයන් අනුව ක්‍රියා නොකිරීම හේතුකොටගෙණ එය අවලංගුකරනුලැබ හෝ සිටින බල්ලකු හෝ බැල්ලියක් රැකබලාගෙන ඉන්නෙක් හෝ අයිතිකාරයෙක් හෝ විනම් ඔහු විසින් නගරබද ප්‍රදෙශසභාවෙන් ඒ සඳහා දැන්වීමක් ලත්විට එහි සඳහන් වේලාවට නගරබද ප්‍රදෙශසභාවේ කන්තෝරුවට ඒ බල්ලා හෝ බැල්ලී ගෙණගොස් උන් බාරගන්ට බලය ලබා සිටින නගරබද ප්‍රදෙශසභාවේ නිලධාරියකුට බාරදියයුතුයි. එවිට එබඳු බල්ලන් සම්බන්ධව සභාපතිතැන නියම කරන පරිද්දෙන් ක්‍රියාකරනු ලැබේ.

7. 1901සේ අංක 25 දරණ බල්ලන් ලියාපදිංචිකිරීමේ ආඥාපණත යටතේ කෝට්ටේ නගරබද ප්‍රදෙශසභාව විසින් සම්පාදිතවූ, වර්ෂ 1902ක්වූ නොවැම්බර් මස 28වෙනි දින නිකුත් අංක 5,892 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ වර්ෂ 1902ක්වූ නොවැම්බර් මස 22වෙනි දින දරන ව්‍යවස්ථා මෙයින් අවලංගුකරනු ලැබේ.

A.—ආකෘති පත්‍රයයි.

බල්ලන් සම්බන්ධව උපනීතිවල නියමිත ලෙඛනයයි.

ගෙදර අංකය :——
වීදිය :——
ගෙහිමියාගේ නම :——

| තබාගෙන සිටින බල්ලන්ගේ ගණන. | විස්තර. | | | | | | අයිතිකාරයාගේ නම. | ගාස්තුව ගෙවූ දිනය. |
|---|---|---|---|---|---|---|---|---|
| | ජාතිය. | පිරිමි සතාද, ගෑනු සතාද. | පාට. | බෙල්ලේ මහත. | විශේෂ ලකුණු. | වැඩිදුර කරුණු. | | |
| | | | | | | | | මාර්තු මස 31වෙනිද හෝ ඊට ප්‍රථම |

ආකෘති පත්‍රය බාරදුන් දවස :——.

————,
ගෙහිමියාගේ අත්සන.

19 —— දින කෝට්ටේදීය.

ඉහත සඳහන් ගෙහිමියා විසින් ඉහත සඳහන් ආකෘතිපත්‍රය පූරවා සතියක් ඇතුලත එවිය යුතුයි. එසේ නොකර පැහැර හරින යම් කෙනෙක් විනම් ඒ අය රු. 20ක දඩයකට යටත් වියහැක.

සභාපතිතුමාගේ අණප්‍රකාර,

————,
ලේකම්.

19 —— දින කෝට්ටේ නගරබද
ප්‍රදෙශසභා කන්තෝරුවේදීය.

B.—ආකෘති පත්‍රය.

බල්ලන් ලියාපදිංචිකිරීමේ සහතිකය.

වීදිය : ——.

ලියාපදිංචිකිරීමේ අංකය : —— අංක ——

දරණ නම :

ගෘහයෙහි වාසයකරණ ————, විසින් පහත සඳහන් විස්තර ඇති බල්ලකු/බැල්ලියක් මේ කන්තෝරුවෙහි ලියාපදිංචිකළ බවද, ඊට නියම ගාස්තුවවූ රුපියල් එකක් ගෙවූ බවද මෙයින් සහතිකකරමි.

බල්ලාගේ/බැල්ලීගේ විස්තර :——.

ජාතිය : ——.

පිරිමි සතාද ගෑනු සතාද යන වග : ——.

පාට : ——.

බෙල්ලේ මහත : ——.

විශේෂ ලකුණු : ——.

මේ සහතිකය වර්ෂ 19 —— මාර්තු මස 31වෙනිදා වනතුරු බල සහිතව පැවතේ.

————,
ලේකම්.

වර්ෂ 19 —— ක්වූ —— වෙනි දින කෝට්ටේ නාගරික ප්‍රදෙශසභා කන්තෝරුවේදීය.

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්

**Kalutara No. 58.**—බස්නාහිර දිසාවේ කලුතර දිස්ත්‍රික්කේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1933ක්වූ අගෝස්තු මස 15වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 9ට හොරණ කාන්තෝරුවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බදුකරන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දු කරන්ට යෙදෙනවා ඇත. බස්නාහිර දිසාවේ කලුතර දිස්ත්‍රික්කේ රයිගම්කෝරලේ කොඨාසයේ පිහිටා තිබෙන බිම් කෑබලි 59ක්.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | මුල් පිඹුරේ නො. 20,230 ගම—කළුපහන. | | | | | | | |
| 4 | ඇදුරුගලකන්ද | — | ආර්. චාර්ල්ස් | පොල් සහ කොස් | 0 | 0 | 15 | 200 |
| | ගම—මාපුටුගල. | | | | | | | |
| 5 | එම | — | ආර්. චාර්ල්ස් | එම | 0 | 0 | 27 | 200 |
| | මුල් පිඹුරේ නො. 19,882. ගම—උරුගල. | | | | | | | |
| 5 | අලුබෝගහවත්ත නොහොත් උරුගුල්කොට | — | ඇස්. උපතේරිස් | රබර් | 1 | 1 | 6 | 150 |
| 8 | එම | — | ආණ්ඩුව | අපිපාරකකොටස | 0 | 0 | 22 | —* |
| | මුල් පිඹුරේ නො. 16,678. | | | | | | | |
| 6 | බටදෙඹගහහේන නොහොත් කිරිගලකන්ද | — | ආණ්ඩුව | කැලේ | 3 | 0 | 23 | —† |
| | මුල් පිඹුරේ නො. 20,010. ගම—මාපුටුගල. | | | | | | | |
| 1 | කබරගලකන්ද | — | ආණ්ඩුව | පාරට ඉතිරිබිම | 0 | 1 | 9 | —* |
| | ගම—රත්මල්ගොඩ. | | | | | | | |
| 2 | එම | — | ආණ්ඩුව | එම | 0 | 0 | 27 | —* |
| 3 | එම | — | එම | ගොඩහොන්බිම | 1 | 0 | 35 | —* |
| 4 | කබරගලකන්ද නොහොත් ගම්ඉමේවත්ත | — | ඩී. සී. ඩබ්ලියු. වික්‍රමසිංහ | රබර් සහ පොල් | 0 | 2 | 30 | 250 |
| 5 | කබරගලකන්ද නොහොත් කබරගලකන්දේවත්ත | — | එච්. සී. පෙද්‍රික්අප්පුහාමි | රබර් | 0 | 1 | 25 | 250 |
| 8 | කබරගලකන්ද නොහොත් කබරගලකන්දේ පාවුල වත්ත | — | කේ. බිරහන්ද | එම | 0 | 1 | 32 | 250 |
| 9 | එම | — | එම | පොල් | 1 | 0 | 1 | 200 |
| 10 | කබරගලකන්ද නොහොත් කන්දේපාවුලවත්ත | — | කේ. සියදොරිස් | රබර් | 0 | 1 | 20 | 250 |
| 11 | එම | — | ඇල්. සින්ගප්පු | එම | 0 | 1 | 0 | 250 |
| 12 | කබරගලකන්ද නොහොත් අඹේදෙනියේකැලේ | — | බී. ජේම්ස්අප්පු | පොල් | 0 | 1 | 31 | 200 |
| 17 | කබරගලකන්ද නොහොත් හතරන්දෙනියේවත්ත | — | ආණ්ඩුව | පාරට ඉතුරු බිම | 0 | 0 | 10 | —* |
| 18 | කබරගලකන්ද නොහොත් හතරන්දෙනියේපිල්ලෑව | — | ඇල්. එලියස් සිඤ්ඤෝ | එලවලුවත්ත | 0 | 0 | 33 | 200 |
| 19 | කබරගලකන්ද නොහොත් හතරන්දෙනියේවත්ත | — | ආර්. ඇල්. සිඤ්ඤෝඅප්පු | රබර් | 0 | 0 | 31 | 250 |
| | ගම—මාපුටුගල. | | | | | | | |
| 21 | කබරගලකන්ද නොහොත් මාහානකුඹුර | — | ඒ. ජේ. පෙරේරා සහ තවත් අය | කුඹුර | 0 | 0 | 9 | 200 |
| 22 | එම | — | පී. බී. ඩයස් | එම | 0 | 0 | 37 | 200 |
| 23 | කබරගලකන්ද නොහොත් ගලවලවිලදෙනිය | — | එම | එම | 0 | 3 | 28 | 200 |
| 24 | ගලවලවිලදෙනිය මාහාන දෙනිය | — | එම | එම | 0 | 1 | 11 | 200 |
| 25 | කබරගලකන්ද නොහොත් ගර්ටන්වත්ත | — | ඒ. එච්. පී. ද සොයිසා | රබර් | 0 | 0 | 12 | 300 |
| 28 | කබරගලකන්ද නොහොත් ගලගොඩවත්ත | — | පී. ඩී. කොර්නේලිස්අප්පුහාමි | පොල් | 0 | 0 | 21 | 150 |
| 31 | කබරගලකන්ද නොහොත් මීගහවත්ත | — | පී. බබ්බුසිඤ්ඤෝ සහ තවත් අය | එම | 0 | 0 | 22 | 250 |
| 32 | කබරගලකන්ද නොහොත් කොස්ලන්දෙවත්ත | — | පී. බබ්බුසිඤ්ඤෝ සහ තවත් අය | පොල් | 0 | 0 | 17 | 200 |
| 33 | කබරගලකන්ද නොහොත් ආචාරිගේවත්ත | — | ඩී. ඩබ්ලිව්. විරස්කොඩි | එම | 0 | 0 | 35 | 250 |
| 34 | එම | — | කේ. මෙතියස් | රබර් | 0 | 0 | 24 | 200 |
| 36 | කබරගලකන්ද නොහොත් දෙලබොඩයායවත්ත | — | එච්. ජී. ප්‍රනාන්දු සහ තවත් කෙනෙක් | පොල් | 0 | 1 | 37 | 250 |
| 38 | කබරගලකන්ද නොහොත් හින්ඇලලගවත්ත | — | එච්. ඇස්. ප්‍රනාන්දු | එම | 0 | 2 | 38 | 250 |
| | මුල් පිඹුරේ නො. 19,899. ගම—මහහේන. | | | | | | | |
| 1 | පින්ලියද්දේඹිට | — | ඒ. සරන්අප්පු | වත්ත | 0 | 0 | 10 | 200 |
| 2 | කන්දපාවුලඹිට | — | ආණ්ඩුව | පාරට ඉතිරි බිම | 0 | 2 | 5 | —* |
| 3 | එම | — | ඒ. සරන්අප්පු | වත්ත | 0 | 0 | 29 | 200 |
| 4 | එම | — | ඒ. ඔද්‍රිස්අප්පු | එම | 0 | 0 | 21 | 200 |
| 5 | එම | — | ආණ්ඩුව | ඹිට | 0 | 0 | 12 | 200 |
| 6 | එම | — | ඒ. මාග්‍රිස් නොහොත් මානිස් | පොල් | 0 | 0 | 14 | 200 |
| 7 | කන්දපාවුලහේන | — | ආණ්ඩුව | ගොඩහොන් බිම | 1 | 1 | 34 | —* |
| 8 | කන්දපාවුලඹිට | — | ඒ. ලියෝරිස්සිඤ්ඤෝ සහ තවත් කෙනෙක් | පොල් | 0 | 1 | 11 | 200 |
| | ගම—බෙල්ලපිටිය. | | | | | | | |
| 9 | එම | — | ඒ. ආග්‍රිස්අප්පු | රබර් | 0 | 0 | 22 | 150 |
| 10 | අකල්ලාවලකුඹුරේඹිට | — | ඒ. ආග්‍රිස්අප්පු සහ තවත් අය | එම | 0 | 0 | 25 | 150 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අත්දම. | මහත, අ. | රූ. | ප. | අන්තරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|---|
| 11 | කන්දපාවුලඹිට | — | ආණ්ඩුව | ඹිට | 0 | 1 | 17 | —* |
| 12 | එම | — | එම | පාරට ඉතුරු බිම | 0 | 0 | 17 | —* |
| 13 | එම | — | එම | හේන | 0 | 0 | 20 | —* |
| 14 | එම | — | එම | එම | 0 | 0 | 23 | —* |
| 15 | කහටගහවත්ත | — | එච්. මැනික්හාමි සහ තවෙකක් | පොල් | 0 | 0 | 26 | 300 |
| 16 | අරංඹිකන්ද | — | ඇම්. ඒ. පෙරේරා මහත්මී | තේ | 0 | 0 | 13 | —† |
| | ගම—මහහේන. | | | | | | | |
| 19 | පැලැදගෙවත්ත | — | පී. ඇල්. සේනන්සිංහ | පොල් | 0 | 2 | 34 | 250 |
| 20 | කජුගහවත්ත | — | ඒ. මායිරිස් | රබර් | 1 | 3 | 18 | 250 |
| 21 | කහටගහවත්ත | — | ඒ. මැන්දිස්අප්පු | රබර් සහ පොල් | 0 | 0 | 32 | 200 |
| 22 | එම | — | ඒ. ජූලිස් | පොල් | 0 | 1 | 3 | 200 |
| 23 | එම | — | ඩබ්ලිව්. ජෝන්අප්පු | පොල් සහ රබර් | 0 | 1 | 25 | 200 |
| 24 | ඉපිවවත්ත | — | පී. ලොරිස්අප්පු | පොල් | 0 | 1 | 7 | 150 |
| 25 | කහටගහවත්ත | — | ඒ. විලියම් | එම | 1 | 1 | 12 | 450 |
| | ගම—රෙමුන. | | | | | | | |
| 26 | අන්නාසිගලවත්ත | — | ඩබ්ලිව්. නෝරිස්අප්පු | පොල් | 0 | 1 | 7 | 250 |
| 28 | පාවුලවත්ත | — | ඇම්. පබිලිස් | එම | 0 | 0 | 11 | 200 |
| 29 | එම | — | කොරනේලිස් පෙරේරා | පොල් සහ කොස් | 0 | 0 | 28 | 200 |
| 30 | ගලමුල්ලේවත්ත | — | ඩී. ඩී. බෙම්පි අප්පුහාමි | රබර් | 0 | 0 | 21 | 200 |
| 31 | එම | — | පී. ඩී. වෝල්ටර් | එම | 0 | 1 | 18 | 200 |
| | ගම—බෙල්ලපිටිය. | | | | | | | |
| 32 | අරංඹිකන්ද | — | ආණ්ඩුව | පාරට ඉතිරි බිම | 0 | 0 | 17 | —* |

* විකිණීමට හෝ බද්දට දීමට නොව ආණ්ඩුවට ඉතිරිකරගැනීම පිණිසයි. † 99 අවුරුද්දේ බද්දට.

මේ ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරණා කළුතර උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් (ප්ලෑන්) කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1933ක්වූ ජුනි මස 22වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්.
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**Kalutara No. 59.**—බස්නාහිර දිසාවේ කළුතර දිස්ත්‍රික්කයේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1933ක්වූ අගෝස්තු මස මස 16වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට හොරණ කචේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බද්දකරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝදනවා ඇත. බස්නාහිර දිසාවේ කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරලේ කොටසයේ පිහිටා තිබෙන කිඹිකැබිලි 86ක්.

මුල් සිතියමේ නො. 20,074. ගම—වැල්මිල්ල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අත්දම. | මහත, අ. | රූ. | ප. | අන්තරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | අඹපාවිලදෙනිය | — | ආණ්ඩුව | දෙනිය | 0 | 0 | 18 | 60 |
| 3 | වැලිහැදෙනිය | — | එච්. කේ. කරුණාරත්න සහ තවත් අය | එම | 3 | 2 | 21 | 60 |
| 5 | වැලිහැදෙනියේඹිට | — | පී. ඒ. පෙරේරා සහ තවත් කෙනෙක් | ඹිට | 0 | 2 | 0 | 60 |
| 6 | ගොඩපරගහවත්ත | — | පී. සී පෙරේරා | රබර් | 0 | 2 | 21 | 100 |
| 7 | එම | — | එම | එම | 0 | 0 | 3 | —* |
| 9 | එම | — | ආණ්ඩුව | හිස්බිම | 0 | 0 | 1 | —* |
| 10 | එම | — | පී. ඒ. පෙරේරා සහ තවත් අය | පොල් | 0 | 2 | 16 | 200 |
| 11 | එම | — | ජී. පොඩිනෝනා සහ තවත් කෙනෙක් | එම | 0 | 0 | 20 | 200 |
| 12 | එම | — | පී. ජේම්ස් පෙරේරා සහ තවත් අය | එම | 0 | 0 | 34 | 200* |
| | ගම—ගොඩිගමුව. | | | | | | | |
| 16 | වල්ගත්කැලේ | — | ආණ්ඩුව | කොහොල්බිම | 2 | 1 | 0 | —* |
| 17 | එම | — | එම | කරත්තපාරට ඉතුරු බිම | 0 | 0 | 13 | —* |
| 18 | එම | — | එම | එම | 0 | 0 | 36 | —* |
| 23 | උරුලෑවල කඹදෙනිය | — | ජී. කේ. පුංචිනෝනා | රබර් | 0 | 0 | 29 | 100* |
| 24 | එම | — | එම | ඹිට | 0 | 0 | 17 | 100 |
| 26 | වල්ගත්කැලේ | — | ආණ්ඩුව | පාරට ඉතිරි බිම | 0 | 1 | 9 | —* |
| 27 | වල්ගමවත්තේකට්ටිය | — | ඩී. ඩී. ඒ. ගුනවර්ධන සහ තවත් අය | එම | 0 | 0 | 37 | —* |
| 28 | එම | — | එම | එම | 0 | 0 | 7 | —* |
| 29 | එම | — | එම | එම | 0 | 0 | 12 | —* |
| 30 | වල්ගත්කැලේ | — | ආණ්ඩුව | එම | 0 | 0 | 17 | —* |
| 33 | වල්ගම්ඹිට හොහොත් බුත්වලඹිට | — | ජී. ජේම්ස් පෙරේරා | ඹිට | 0 | 0 | 13 | 100 |
| 34 | බුත්වලකුඹුරේඹිට | — | ආණ්ඩුව | සාමත | 0 | 0 | 15 | —* |
| | ගම—ගම්මන්පිල. | | | | | | | |
| 35 | නාගස්පල්ලේ කුඹුරේ ඹිට | — | ආණ්ඩුව | එම | 0 | 0 | 17 | —* |
| 38 | එම | — | එම | එම | 0 | 0 | 19 | —* |
| 41 | පුරන්මුල්ලේඹිට | — | එම | එම | 0 | 0 | 27 | —* |
| 42 | එම | — | එම | එම | 0 | 0 | 26 | —* |
| 43 | වල්ගත්කැලේ | — | එම | මුඩුඉඩම | 2 | 0 | 20 | —* |
| 44 | එම | — | එම | පාරට ඉතිරි බිම | 0 | 0 | 24 | —* |
| 45 | වල්ගමවත්ත | — | ජී. වී. පෙරේරා සහ තවත් අය | එම | 0 | 0 | 13 | —* |
| 46 | එම | — | ඩී. ඇම්. ගම්මන්පිල | රබර් | 0 | 0 | 16 | 100 |
| 47 | එම | — | ආණ්ඩුව | පොල් | 0 | 0 | 19 | —* |
| 48 | වල්ගත්කැලේ | — | ආණ්ඩුව | පාරට ඉතිරි බිම | 0 | 1 | 0 | —* |
| 49 | එම | — | එම | එම | 0 | 1 | 20 | —* |
| 51 | දෙල්ගහවත්ත | — | සී. ඒ. ගුණරත්න | රබර් | 0 | 0 | 34 | 200 |
| 52 | එම | — | එම | එම | 0 | 0 | 30 | 200 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකාරයන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අත්කරගත මිල, රු. |
|---|---|---|---|---|---|---|---|---|
| 53 | වල්ගන්කැලේ | — | ආණ්ඩුව | පාරට ඉතිරි බිම | 0 | 1 | 4 | —* |
| 54 | වල්ගන්කැලේවත්ත | — | එම | පොල් සහ කුරුඳු | 0 | 1 | 7 | —* |
| 55 | එම | — | එම | කුරුඳු | 0 | 0 | 5 | —* |
| 56 | දෙල්ගහවත්ත | — | එම | රබර් | 0 | 0 | 20 | —* |
| 57 | එම | — | එම | එම | 0 | 0 | 5 | —* |
| 58 | වල්ගන්කැලේවත්ත | — | එච්. ඩී. ඇස්. කරුනාරත්න | කුරුඳු | 0 | 0 | 13 | 100 |
| 59 | එම | — | එම | එම | 0 | 0 | 16 | 100 |
| 61 | වල්ගන්කැලේ | — | ආණ්ඩුව | පාරට ඉතිරි බිම | 0 | 0 | 17 | —* |
| 62 | වත්තේගමමූකලාන වත්ත | — | ජී. ඒබ්‍රහම් අප්පුහාමි | එම | 0 | 0 | 4 | —* |
| 63 | එම | — | පී. සිඤ්ඤෝ අප්පු සහ තවත් අය | එම | 0 | 0 | 35 | —* |
| 64 | එම | — | ආණ්ඩුව | මුඩුබිම | 0 | 0 | 9 | —* |
| 70 | වල්ගන්කැලේ | — | එම | පාරට ඉතිරි බිම | 0 | 3 | 37 | —* |
| 71 | එම | — | එම | එම | 0 | 2 | 33 | —* |
| 74 | එම | — | එම | එම | 0 | 0 | 24 | —* |
| 75 | එම | — | එම | එම | 0 | 0 | 7 | —* |
| 76 | බටපොත්තේවත්ත | — | සී. ජී. ගුණරත්න | රබර් | 0 | 0 | 22 | —* |
| 77 | හඳුන්වෙන්නගහවත්ත | — | ඩබ්ලියු. ඩී. සර්නේලිස් අප්පුහාමි | පොල් | 0 | 0 | 9 | —* |
| 78 | එම | — | ආණ්ඩුව | එම | 0 | 0 | 9 | —* |
| | | | ගම—අලුත්ගම. | | | | | |
| 79 | එම | — | ඩබ්ලියු. ඩී. සර්නේලිස් අප්පුහාමි | එම | 0 | 0 | 16 | 150 |
| 80 | වල්ගන්කැලේවත්ත | — | එම | කොස් | 1 | 0 | 32 | 100 |
| 82 | කොස්ගහවත්ත නොහොත් වල්ගන්කැලේවත්ත | — | ඩී. ඇස්. කරුණාරත්න | රබර් | 0 | 0 | 27 | 100 |
| 83 | එම | — | එම | එම | 0 | 2 | 25 | 100 |
| 87 | කොස්ගහවත්ත | — | ආර්. මාකිස් සිල්වා | එම | 0 | 0 | 10 | 100 |
| 91 | වල්ගන්කැලේවත්ත | — | ආර්. බස්තියන් සිල්වා | එම | 0 | 0 | 15 | 150 |
| | | | ගම—පේරුකාන. | | | | | |
| 93 | වරද්දෙඩුබුවාඅද්දර ඔවිට | — | ජේ. ඩී. චාර්ල්ස් සහ තවත් දෙදෙනෙක් | ඔවිට | 0 | 1 | 2 | 100 |
| 94 | දික්හේනේකැලේ | — | ආණ්ඩුව | පාරට ඉතිරි බිම | 0 | 0 | 36 | —* |
| 95 | එම | — | එම | එම | 0 | 2 | 26 | —* |
| 96 | ගල්පොත්තේවත්ත | — | පී. ජේ. පෙරේරා | රබර් | 0 | 0 | 28 | 100 |
| 97 | අලුබෝගහවත්ත නොහොත් මූනමල්ගහ වත්ත | — | ආණ්ඩුව | කැලේ | 0 | 1 | 1 | —* |
| 98 | ගොඩපරගහවත්ත | — | ඩී. ඇස්. ගුණතිලක | රබර් | 0 | 0 | 11 | 100 |
| 99 | එම | — | ආණ්ඩුව | කැලේ | 0 | 3 | 11 | —* |
| 100 | දික්හේන නොහොත් වල්ගන්කැලේ | — | එම | කරත්ත පාර | 0 | 2 | 24 | —* |
| | | | ගම—බොලබොටුව. | | | | | |
| 101 | එම | — | එම | පාරට ඉතිරි බිම | 0 | 0 | 22 | —* |
| 102 | දෙහිතුඹුවේවත්ත | — | පී. පබිලිස් සිඤ්ඤෝ | පොල් | 0 | 2 | 10 | 100 |
| 104 | දික්හේන නොහොත් වල්ගන්කැලේ | — | ආණ්ඩුව | පාර සහ කැලේ | 0 | 3 | 29 | —* |
| 105 | වැවබොඩවත්ත | — | එම්. ඩී. එච්. ජයවර්ධන | රබර් | 2 | 0 | 26 | 100 |
| 106 | එම | — | ආර්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහත්මී | එම | 0 | 0 | 36 | 100 |
| 107 | ගල්වලදෙනිය | — | ඇම්. සීමොන් සහ තවත් අය | කුඹුර | 1 | 2 | 3 | —* |
| 108 | ගමේදෙනිය | — | ඇම්. ඩී. පොරෝලිස් අප්පුහාමි සහ තවත් අය | එම | 1 | 0 | 17 | —* |
| 112 | බොලබොටුවවැව | — | ආණ්ඩුව | වැව | 22 | 1 | 5 | —* |
| | | | මුල් සිතියමේ නො. 20,002. ගම—ගොඩිගමුව. | | | | | |
| 1 | කැකිරිදෙනියේ ඉස්මත්තේඔවිට | — | ඩී. දොන් කරෝලිස් | ඔවිට | 0 | 0 | 11 | 150 |
| 4 | කෝන්ගහහේන | — | කේ. ජී. පෙරේරා | කුරුඳු | 0 | 2 | 25 | 200 |
| 5 | කාරියවසන්හේන | — | පී. බස්තියන් පෙරේරා | පොල් | 1 | 1 | 32 | 200 |
| | | | ගම—පේරුකාන. | | | | | |
| 6 | කැකිරිදෙනියේ ඉස්මත්තේඔවිට | — | ඩී. ඩී. කරෝලිස්අප්පු | ඔවිට | 0 | 0 | 14 | 150 |
| 9 | හාලියාකැලේ | — | ආණ්ඩුව | මූකලාන | 0 | 0 | 14 | —* |
| 11 | එම | — | එම | එම | 1 | 2 | 29 | —* |
| 12 | එම | — | එම | එම | 0 | 0 | 5 | —* |
| 14 | හාලියාකැලේවත්ත | — | ඩී. ජී. විජේමාන්න | රබර් | 0 | 0 | 14 | 200 |
| 15 | හාලියාවත්තේදෙනිය | — | කේ. රන්හාමි | පොල් | 0 | 0 | 18 | 150 |
| 18 | එම | — | ඇම්. මෙනෙස්අප්පුහාමි | ඔවිට සහ කුඹුර | 0 | 0 | 23 | 150 |
| 21 | හාලියාකැලේ | — | ආණ්ඩුව | මූකලාන | 0 | 0 | 14 | 200 |
| | | | මුල් සිතියමේ නො. 19,790. ගම—පානකඩ. | | | | | |
| 2 | තුන්තිපිංගොඩලන්ද | ඒ. බෙම්පි සිල්වා | ආණ්ඩුව | කැලේ | 1 | 1 | 34 | —† |

* විකිණීම හෝ බේරුම්කරදීම පිණිස නොව ආණ්ඩුවට ඉතිරිකරගැනීම පිණිසයි. † 99 අවුරුද්දේ බද්දට.

මේ ඉඩම් සම්බන්ධ වැඩිදුර තොරතුරු කලුතර උප දිසාපති තුමාගෙන්ද ඒවායේ සිතියම් (ප්ලෑන්) සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

එම් 1933ක්වූ ජූනි මස 22වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 17වෙනි දින නිකුත්කරණලද අංක 7,972 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකරණලද උඩ දිසාවේ කොටුවැනිගමේ මුල් සිතියමේ නොම්මර 338වේ කොටුවේ අංක 10,578 සහ 10,579 දරණ ඉඩම් විකිණීම් පත්‍ර මෙයින් අවලංගු කරන්ට යෙදුනා ඇත.

වර්ෂ 1933ක්වූ ජුනි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—විල්ගොඩ රෙදි වියන සෝලයක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A. 69. ගම—විල්ගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කොස්ගහවත්ත .. | පොල්ගස් 12ක්ද, දෙහිගස් 2ක්ද, පැපොල්ගස් 4ක්ද, දෙළුන්ගස් 2ක්ද, ජම්බෝලගස් 2ක්ද, පුවක්ගස් 1ක්ද, නාරන්ගස් 1ක්ද, සියඹලා ගස් 1ක්ද, උළු සෙවිලිකළ මැටියෙන් බඳින ලද රෙදි වියන සෝලයක්ද අතුසෙවිලිකළ මැටියෙන් බඳිනලද මඩුවක් සහ කම්බි වැටකින් යුත් පොල්ඉඩම | ඩී. ජේ. සේනානායක .. | 0 1 0·8 |

එබැවින් ඉඩම අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1933ක්වූ අගෝස්තු මස 16වෙනි දින පෙරවරු 10ටත් කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1933ක්වූ ජුනි මස 16වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ආර්. ඇස්. වී. පොලියර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පත්තලගෙදර ගෑනු පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A. 73. ගම—තල්ගස්මොටේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | බණ්ඩාරවත්ත .. | පොල්ගස් 31ක්ද, දිඹුල්ගහක්ද, තාවකාලික වලවල් 7ක්ද, තාවකාලික ලිං දෙකක්ද, අතුසෙවිලිකළ වැසිකිළියක්ද, අතුසෙවිලි කළ ගෑනු පාඨශාලාවක් සහ අතුසෙවිලි කළ මැටියෙන් බඳිනලද ගෙයකින් යුත් පොල්ඉඩම | කේ. මාටින් පෙරේරා. තල්ගස්මොටේ .. | 0 2 22·9 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1933ක්වූ අගෝස්තු මස 16වෙනි දින පෙරවරු 10.30ත් කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1933ක්වූ ජුනි මස 16වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ආර්. ඇස්. වී. පොලියර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—අම්බලන්ගොඩ සිට ඇල්පිටියට යන මහාපාරේ තුන්වෙනි හැතැප්ම කණුව අසල ආණ්ඩුවේ ගල්වලට යෑමට පාරක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 40. ගම—කරන්දෙනිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මාරගහවත්ත නොහොත් එපිටවත්ත | අවුරුදු 35ක් පොල්ගහක්ද අවුරුදු 12ක් කොස් ගහක්ද තිබෙන ඉඩම | කරන්දෙනියේ පදිංචි ඉලන්දාරිදේව බබුසේ | 0 0 15·1 |
| 2 | එම .. | හිස්ඉඩම .. .. | ඉලන්දාරිදේව සින්ඤෝ .. .. | 0 0 8·4 |
| 3 | එම .. | කරත්ත පාරක කොටසක් ඇතුළු හිස් ඉඩම | කරන්දෙනියේ පදිංචි (1) වී. එච්. ජෙස්ලින්, (2) අයි. ඩී. අයිදිරිස්, (3) අයි. ඩී. කිරිනෝරිස් | 0 0 19·3 |
| 4 | එම .. | අවුරුදු 40ක් පොල්ගහක් තිබෙන ඉඩම | කරන්දෙනියේ පදිංචි ඉලන්දාරිදේව ඉසාරිස් | 0 0 10·9 |
| 5 | මාරගහවත්තේඔවිට .. | අවුරුදු 25ක් පුවක්ගස් දෙකක් සහ කරත්තපාරක කොටසක් ඇතුළු ඉඩම | කරන්දෙනියේ පදිංචි ඉලන්දාරිදේව ඔසිස් .. | 0 0 3·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1933ක්වූ ජූලි මස 24වෙනි දින පස්වරු 2ටත් කනිසමට අම්බලන්ගොඩ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1933ක්වූ ජුනි මස 16වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ඩී. ජේ. හඩ්සන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දෙල්දූවේ ආණ්ඩුවේ ස්වභාෂා මිශ්‍ර පාඨශාලාව දියුණුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

මුල් සිතියමේ නො. A 73. ගම—දෙල්දූව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කලුකලගේවත්ත .. | අවුරුදු 20ක් පොල් ගස් 3ක්ද කොස් ගහක්ද කෙසෙල් පඳුරු 2ක්ද කුරුඳු පඳුරු 50ක්ද වැසි කිළියක්ද තිබෙන ඉඩම | දෙල්දූවේ පදිංචිකාර (1) ඇම්. ජන්හාමි, (2) අල්බරදූර එමානියෙල්, (3) කළුගල මාටින් අල්විස්, (4) රත්ගමයේ කරෝලිස් සිල්වා, (5) කළුගල චාර්ලිස් අල්විස්, (6) රත්ගමයේ පූරලිස් සිල්වා, (7) විජේමුනි තේලිස් සිල්වා, (8) තිරිමාදූර සිරිනේරිස් මැන්දිස්, (9) කළුගල නන්දෙදූරිස් සිල්වා, (10) වික්‍රම රූසිවින් සොයිසා, (11) අල්බරදූර නම්පියෙල්, (12) කළුගල පාලියස් සිල්වා, (13) එම අප්පු සිංඤෝ, (14) පොන්නාහන්දි සයනේරිස් | 0 0 13·8 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමූන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1933ක්වූ ජූලි මස 24වෙනි දින අපරභාග 1.30ගේ කණිසමට අම්බලන්ගොඩ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1933ක්වූ ජූනි මස 16වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

පී. ජේ. හඩ්සන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ 7වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දකුණු දිසාවේ මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩපත්තුවේ දික්වැල්ලේ පොලිසියේ "ගරාජ්" එකක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A. 61. ගම—දික්වැල්ල දකුණ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කලපුවඅද්දරවත්ත .. | ටීට් සෙවිලිකොට බැම්මෙන් තනනලද ගරාජයක කොටසක් තිබෙන වැටිලි ඉනාමැති වත්ත | හාබඩුන්නෙගේ දෙන් අන්ද්‍රයස් ද සිල්වා, දික්වැල්ලේ විදන ආරච්චි | 0 0 2·3 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමූන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1933ක්වූ ජූලි මස 29වෙනි දින දවල් 12.15ගේ කණිසමට දික්වැල්ලේ පොලිසියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1933ක්වූ ජූනි මස 20වෙනි දින
මාතර කච්චේරියේදීය.

ඇස්. එච්. වාඩියා,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

## ටැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

### තොටුපල් රේන්ද විකිණීම.

වර්ෂ 1933ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්ෂ 1934ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා මෙහි පහත සඳහන්වන කෑගල්ල දිස්ත්‍රික්කයේ තොටුපල් රේන්ද මිළයට ගැණීමට එවන මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර කෑගල්ල දිස්ත්‍රික්කයේ උප ඒජන්තතුමා විසින් වර්ෂ 1933ක්වූ අගෝස්තු මස 5වෙනි සෙනසුරාදා උදේ 10ට වනතුරු කෑගල්ලේ කච්චේරියේදී භාරගන්ට යෙදෙන බව මෙයින් දැනගත යුතුයි.

2. (*a*) මෙහි පහත සඳහන් ප්‍රකාර එක එක රේන්දෙට වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර එවිය යුතුයි. රේන්දවලට ඉල්ලුම්පත්‍රකාරුවෝම පැමිණ සිටිය යුතුයි. එසේ නැත්නම් ඔවුන් යුතු ප්‍රකාර බලයලත් ඒජන්තවරු විසින් ඉල්ලුම්පත්‍රවල සත්‍යයතාවය උප ඒජන්ත උන්නාන්සේට පෙන්නා සිටිය යුතුයි.

(*b*) ඉල්ලුම්පත්‍රවල පිට කවරය නොහොත් ඇන්විලොප් එක මතුපිට වම් පැත්තේ උඩ කෙළවරේ "Tenders for Toll Rents" කියා ලකුණුකරන්ට ඕනෑය. තවද ඉල්ලුම් කරණ රේන්දේ නමත් එහි සඳහන්කළ යුතුයි.

3. භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයා විසින් ඒ මුදලෙන් දහයෙන් කොටසක් වහාම කච්චේරියේ තැන්පත් කරන්ට ඕනෑය. එකී විකිණීමේ දින පටන් දවස් තිහක් ඇතුළතදී එම ඉල්ලූ ගණනින් දෙකෙන් පංගුවකට වටිනා ඇප ඒත්තුගත් මුද්‍ර ඔප්පුවලින් හෝ තුනෙන් පංගුවකට වටිනා ඇප මුදලෙන් හෝ තබා සම්පූර්ණකරන්ට ඕනෑය.

4. තවද ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා ආණ්ඩුවේ අද්වකාත්තුමාට ගෙවියයුතු ගාස්තුවද, ඇප ඔප්පු සෑදීමටද, ඒවා සෝදිසිකර සම්පූර්ණකිරීමටද, ඉඩම් තක්සේරු කිරීමට හා ඇප ඔප්පු රෙජිස්ත්‍රකිරීමට ගෙවියයුතු ගාස්තුත් ඔහු විසින් ගෙවීමට මෙහි තැන්පත්කරන්ට ඕනෑය.

5. තොටුපල් රේන්දය විකිණීමේ කොන්දේසි අනුව තවද ඉල්ලුම්කරු විසින් ඔහුගේ නීතිඥයාගේ මාර්ගයෙන් නඩු නිඤුවම එකඟවීමේ G. A. C. 81 දරන සහතිකපත්‍රයක් එවිය යුතුයි.

6. ඇප වෙනුවෙන් බදිනලද ඉඩම්වල ඔප්පු ඒවා මීට ප්‍රථම ඇපයකට නොහොත් උගසකට බැඳී නැති බවට ඉඩම් ලියාපදිංචිකරණ රෙජිස්ත්‍රාර්තුමාගෙන් සහතිකපත්‍රයක් ලබාගත යුතුයි. මේ සහතිකපත්‍රය ලබාගැණීමට ගාස්තුව ඇප තබන අය විසින් ගෙවිය යුතුයි.

7. අලව්වේ තොටුපල සම්බන්ධ එහි බදුගෙවීමේ කාල සීමාව ගතවන්ට පළමු එහි පාලම රථ වාහන ගෙනයාමට විවෘතකළොත් තොටුපල් රේන්ද අයකිරීමේ බලය අවලංගු වෙනවා ඇත. එසේ ඒ අවලංගුකරණලද දිනය වනතුරු පමණක් රේන්ද ගාස්තු ගෙවිය යුතුයි.

8. මේ ගැන වැඩිදුර කාරණා කෑගල්ලේ උප ඒජන්තතුමාගෙන් ඉල්ලා දැනගත යුතුයි.

කෑගල්ල දිස්ත්‍රික්කුව: (1) රුවන්වැල්ලේ කැලණිගඟේ තොටුපල් රේන්දය.

(2) රුවන්වැල්ලට නුදුරුවූ අඟුරුවැල්ලේ ගුරුගොඩ ඔයේ තොටුපල් රේන්දය. මෙයින් එක රේන්දපලක රේන්ද කාසි ගෙවිවොත් ඒ දවස තුළදී අනිත් රේන්දපලෙත් ගෙවීම නිදහස්ය.

(3) මාපිටිගම රේන්දපල.

(4) අලව්වේ මහඔය තොටුපල.

ජේ. එච්. ලූසම්,
ඒජන්තතුමා වම්හ.

වර්ෂ 1933ක්වූ ජූනි මස 19වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.